සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය මගින් කොවිඩ්-19 වාර්තාකරණය සඳහා ජනමාධ්‍යවේදීන් හට නිර්දේශ කොට ඇති ආචාර ධර්ම මාලාවේ 'රෝගීන් වැළඳුණු පුද්ගලයින් රෝගීන් ලෙසින් මිස රෝගය පතුරුවන්නන් ලෙසින් වාර්තා නොකළ යුතු' බව සඳහන් වේ.
කෙසේ නමුත් එම නිර්දේශයන් ජනමාධ්‍ය මගින් කඩ කරනා අවස්ථාවන් අපට හමුවේ. උදාහරණයක් ලෙසින් මෙම දිවයින පුවත දැක්විය හැක.

මෙහිදී සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පනවා ඇති නිර්දේශයන් අදාළ වන්නේ ශ්‍රී ලංකාව තුළට පමණක් යැයි යමෙකු තර්ක කළ හැක. කෙසේ වෙතත් ගැටළුව වන්නේ අදාළ පුවත ශ්‍රී ලංකාවේද නැතිනම් ශ්‍රී ලංකාවෙන් පිටද යන්න නොව, මෙවන් සිරස්තලයක් මගින් දිවයින ලබාදෙන්නා වූ වැරදි පූර්වාදර්ශයයි. ජනමනස හැඩගැස්වීමෙහි ලා ජනමාධ්‍ය මගින් ලබාදෙන දායකත්වය දෙස බලනා විට, මෙවන් ආචාර ධාර්මික උල්ලංඝනයන් අපට බරපතළ ලෙසින් ගණන් ගැනීමට සිදුවේ.

එසේම නිවැරදි අක්ෂර වින්‍යාසය වන්නේ "ආසාදිතයෙක්" යන්න බවද මෙහිදීම අපි පෙන්වා දෙමු.

#MediaEthicsSL #lka #SinhalaPress #News #COVID19 #Coronavirus #Divaina